# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 09/2015 (i)**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2016 අප්‍රියෙල් මස 26 වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**ලිපිකරු / ගබඩා භාරකරු/ සරප්/ පරිගණක යෙදවුම් සහකාර තනතුරුවල II ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත පරීක්ෂණය**

උක්ත ශීර්ෂපාඨය යටතේ වූ 2015.08.25 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2015 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2. කොමිෂන් සභාව, 2016.03.24 දින පැවති සිය 937වන සභා වාරයේ දී කොමිෂන් සභා චක්‍රලේඛ අංක 09/2015 හි 4වන ඡේදයේ සඳහන් කර ඇති ඉහත කී ලිඛිත පරීක්ෂණයේ II ප්‍රශ්නපත්‍රයේ එක් එක් කොටසින් පිළිතුරු සැපයීමට නියමිත ප්‍රශ්න සංඛ්‍යාව පහත පරිදි පරිදි සංශෝධනය කිරීමට තීරණය කර ඇත.

II ප්‍රශ්නපත්‍රය - **ගිණුම්, මූල්‍ය සහ ගබඩා පරිපාටි, අංක ගණිතය, වාණිජ අංක ගණිතය, ගණිතය සහ පරිගණනය**

අපේක්ෂකයන් "ඒ", "බී", "සී" කොටස් තුනෙන් ප්‍රශ්න පහකට (05) පහත පරිදි පිළිතුරු සැපයිය යුතුය;

**'ඒ' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකකට (02)**

'ඒ' කොටස - [ප්‍රශ්න හතරයි (04)]
ආවරණය කළ යුතු විෂය ක්ෂේත්‍ර - අංක ගණිතය, වාණිජ අංක ගණිතය, ගණිතය

**සහ**

**'බී' කොටස සහ /හෝ 'සී' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකකට (02)**

'බී' කොටස - [ප්‍රශ්න තුනයි (03)]
ආවරණය කළ යුතු විෂය ක්ෂේත්‍ර - ගිණුම්, මූල්‍ය සහ ගබඩා පරිපාටි

'සී' කොටස - [ප්‍රශ්න තුනයි (03)]
ආවරණය කළ යුතු විෂය ක්ෂේත්‍ර - අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, මූලික පරිගණක ආරක්ෂණය, පද සැකසුම, පැතිරුම් පත් ඇතුළත් ව පරිගණක නිපුනතාව

3. කරුණාකර ඉහත විධිවිධාන අනුව කටයුතු කිරීමට සහ මෙය අදාළ සියලු කාර්ය මණ්ඩල කාණ්ඩවල අවධානයට යොමු කිරීමට පියවර ගන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති